---

## මන්මුනෙයි දකුණ - එරුවිල් පත්තු ප්‍රාදේශිය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය .

### 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 06 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 05 දින ඉදිරිපත් කර තිබුණි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 20 උන සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි

### 1.2 . මතය .

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, මන්මුනෙයි දකුණ - එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ - එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන් හි විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි .

---

(ආ) ස්ථාවර වත්කම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිසම්පාදන සංචිතයක් ප්‍රතිපාදන කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු භාණ්ඩ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන් හි ඇතුලත් කර නොතිබුණි .

(ඈ) වටිනාකම රු.48,216 ක් වූ තොග භෞතිකව හරිවැරදි බැලූ වටිනාකමට නොව පොත් අගයට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා නොතිබුණි.

(ඉ) රු.14,813,592 ක් වටිනාකම වූ ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොතිබුණි.

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2 .1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු . 2,522,785 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,442,466 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| (i) වරිපනම් සහ බදු | 108 | 182 | - |
| (ii) කල්බදු කුලී | 8,965 | 8,750 | 215 |
| (iii) බලපත්‍ර ගාස්තු | 470 | 455 | 15 |
| (iv) වෙනත් ආදායම් | 1,066 | 545 | 521 |

2.2.2 උසාවි දඩ

------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරින් ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ ප්‍රමාණය රු . 4,438,543ක් විය.

2 .3 අවිධිමත් ගනුදෙනු

----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 173 සහ 174 වගන්ති ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකොට , සභාවේ මන්ත්‍රිවරයෙකුට රු . 2500 ක් වූ මාසික කුලියකට අවුට් බෝඩ් ඇන්ජිමක් සහිත රු.460,000 ක් වටිනා ධීවර යාත්‍රාවක් කුලියට දී තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 219 වගන්තියට පටහැනිව , සභාව සහ මන්ත්‍රිවරයා අතර මේ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ තිබුණි . තවද එන්ජිම සහිතව ධිවර යාත්‍රාව ආපසු සභාවට භාර දී නොතිබුනු අතර ප්‍රයෝජනයට නොගැනිම හේතුවෙන් එය දිරාපත් වි ඇති බව සඳහන් කර තිබුණි.

3 . පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඈ) අයවැය පාලනය

s/s .